# සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

**Ministry of Finance, Economic Stabilaization & National Policies**

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/General/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 29 . 07. 2022 |
|---|---|---|---|---|---|

ප්‍රාදේශීය ලේකම් තුමනි /තුමියනි,

<u>සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම</u>

ඔබට ද පිටපතක් සහිතව සියළුම දිස්ත්‍රික් ලේකම් වරුන් ඇමතු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HA/02/26/03/10 හා 2022.07.20 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති පරිදි, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය ඔබේ සහාය මත දිප ව්‍යාප්තව අඩු ආදායම්ලාභී පවුල්වල තොරතුරු රැස්කරමින් සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් සිටියි.

මෙම තොරතුරු පත්‍රිකා මුද්‍රණය කිරීමට අවශ්‍ය කඩදාසි හිඟය, ඉන්ධන ගැටළු , මූල්‍ය අසීරුතා යන හේතු නිසා රාමුවෙන් බැහැරව යමින් සිට පිළියම් සෙවිය යුතුය. ඒ අනුව ජංගම දුරකථන යෙදවුමක් මගින් විසඳුම් ක්‍රියාමාර්ගයක් යෝජනා කිරීම සඳහා එහි ඇති ශක්‍යතාව ඇගයීමට පහත සඳහන් විමසීම් සඳහා ඔබගේ කඩිනම් ප්‍රතිචාරය 2022.08.05 දිනට පෙර මේ සමග විද්‍යුත් තැපැල මගින් යොමු කර ඇති සබැඳිය හරහා එවනමෙන් කාරුණිකව ඉල්ලමි.

01. ඔබ බලප්‍රදේශයේ සිටින මුළු සමාජ ආරක්ෂණ ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව (සමෘද්ධි, සමාජ සේවා ආදී සියළු සමාජ ආරක්ෂණ වැඩසටහන් යටතේ දැනට ප්‍රතිලාභ ලබන්නන් සහ පොරොත්තු ලේඛනවල ඇතුලත් සංඛ්‍යාවේ මුළු එකතුව)
02. ගමනාගමනය සඳහා පා ගමනින් හෝ පාපැදිය භාවිතා කරමින් දත්ත රැස් කිරීමට අවම වශයෙන් කොට්ඨාශය තුළ යොදා ගත හැකි නිලධාරීන් සංඛ්‍යාව.
03. නිලධාරීන්ගේ පෞද්ගලික smart phone (3G හෝ ඉහළ පහසුකම් සහිත) පාවිච්චි කරමින් දත්ත රැස් කිරීමට කැමති නිලධාරීන් සංඛ්‍යාව.
04. පා ගමනින් හෝ පා පැදිය භාවිතා කරමින් සහ පෞද්ගලික smart phone භාවිතා කරමින් එක් පවුලක තොරතුරු ලබාගැනීම සඳහා එක් නිලධාරියෙකුට ප්‍රවෝත්සාහක දීමනාවක් ලෙස ගෙවිය යුතු යැයි යෝජනා කරන මුදල.
05. එම නිලධාරීන්ට හෝ සහායකයකුගේ මාර්ගයෙන් හෝ දත්ත රැස් කිරීමට හැකියාවක් ඇත් ද යන වග.

සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා මෙයින් ලැබෙන ඔබගේ සහාය ඉතා අගය කොට සළකමි.

කේ. පී. ආර්. ප්‍රනාන්දු.

අතිරේක කොමසාරිස්

අත්/කළේ බී. විජයරත්න.

සභාපති

පිටපත:- සියළුම දිස්ත්‍රික් ලේකම්වරු - කා.දැ. ගැ. ස.